COMMITTEE OFFICE
18 JUN 2019
PARLIAMENT OF SRI LANKA

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
இசுருபாய, பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/6707/03/06 (IIවෙළුම)  ඔබේ යොමුව / உமது இல. / Your Ref. PSC/EST/02-01-34-01/2019  දිනය / திகதி / Date 2019.06.10

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති සහායක නිලධාරීන්ගේ තනතුරු නාමය, ව්‍යාපෘති නිලධාරි ලෙස වෙනස් කර MN 6 වැටුප් කාණ්ඩය ලබාදීම.**

ඉහත කරුණට අදාළව උසස් කිරීමේ පටිපාටිය මාගේ සමාංක හා 2019.04.09 දිනැති ලිපිය මගින් ඔබේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි.

02. ඊට පිළිතුරු ලෙස එවා ඇති ඔබේ සමාංක හා 2019.05.30 දිනැති ලිපිය මගින් දක්වා ඇති සංශෝධන සම්බන්ධව 2019.06.04 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවති අධ්‍යාපන ආංශික අනුකමිටුවේ දී සාකච්ඡා කරන ලද අතර, ඒ අනුව සකස් කරන ලද උසස් කිරීමේ පටිපාටිය මේ සමඟ ඉදිරිපත් කරමි.

03. නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති සහායක නිලධාරීන් 1997.04.01 දින සිට මෙම අමාත්‍යාංශයට බඳවා ගෙන ඇත. ඔවුන්ගේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගෙන වසර 07 ක් ඉක්මවීමට පෙර (2004.04.01) දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගත යුතු බව නියම කර තිබේ. මේ වන විට නිලධාරීන් 128 දෙනෙකු නියමිත පරිදි සුදුසුකම් සපුරා ඇති අතර,ඉතිරි 70 දෙනාට සුදුසුකම් සපුරා ගත් පසු MN 06 වැටුප් කාණ්ඩය ලබා දීමට අනුමැතිය ලැබී ඇත.

04. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අධ්‍යාපන අනු කමිටුවේ 2018.10.09 දින පැවති රැස්වීමේ තීරණයට අනුව ව්‍යාපෘති සහායක තනතුරු නාමය ව්‍යාපෘති නිලධාරි ලෙස වෙනස් කිරීමටත්, 2013.11.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි MN 06 වැටුප් කාණ්ඩය ලබා දී පියවරට පියවර අනුව වැටුප් පරිවර්තනය කිරීමටත්, උපදෙස් ලබා දී ඇත. (ඇමුණුම 01)

05. දැනට MN 06 වැටුප් කාණ්ඩයේ වෙනත් තනතුරුධාරීන්ට අනෙකුත් සේවා අවශ්‍යතා සමඟ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කල විට 1 ශ්‍රේණියට උසස් වීමට අවස්ථාව ලැබේ. මේ වන විට ව්‍යාපෘති සහායක නිලධාරීන් පශ්චාත් උපාධි සම්පූර්ණ කර වසර 15 ක් ගතව ඇති අතර,සේවා කාලය වසර 22 කි.

06. මෙම කරුණු හා 2018.10.09 දිනැති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යාපන අනුකමිටුවේ තීරණ සැලකිල්ලට ගෙන ව්‍යාපෘති සහායක තනතුරු නාමය ව්‍යාපෘති නිලධාරි ලෙස සංශෝධනය කිරීමටත්, පළමු කාර්යක්ෂමතා කඩඉම සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 128 දෙනා සඳහා 2013.11.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි MN 06 වැටුප් කාණ්ඩයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර, පියවරට පියවර අනුරූපී වැටුප් තලයේ පිහිටුවීමටත්, නිර්දේශ කරන අතර, ඒ අනුව සකස් කරන ලද උසස් වීම් පටිපාටිය මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.එන්.රණසිංහ,

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය.